රුහුණ විශ්වවිද්‍යාලය
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

**2020/2021 අධ්‍යයන වර්ෂය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2022 අගෝස්තු**

## SOC 6244 - ගෝලීයකරණය සහ සංවර්ධනය

<u>**ප්‍රශ්න හතරකට (04) පමණක්**</u> පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගිනි. පැහැදිලි අත්අකුරෙන් පිළිතුරු සපයන්න.

**කාලය : පැය තුනයි.**

---

1. "අන්තර් ජාතික මට්ටමින් සිදු වී ඇති ආර්ථික, සංස්කෘතික රඳා පැවැත්ම ගෝලීයකරණය නම් වේ." ගෝලීයකරණයේ විවිධ පැතිකඩ ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

2. ආර්ථික ගෝලීයකරණය හමුවේ ශ්‍රී ලංකාව දීර්ඝ කාලීනව මුහුණ දෙමින් සිටින ආර්ථික අර්බුදය කෙරෙහි බලපා ඇති හේතූන් ඔබ හඳුනා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

3. "ගෝලීයකරණය හමුවේ තෙවන ලොව රටවල් මුහුණ දී ඇති අභියෝග අතුරින් පාරිසරික තිරසාරභාවය බිඳ වැටීම වඩා ප්‍රබල වූවක් වේ." සනිදර්ශනාත්මකව විමසීමට ලක් කරන්න.
(ලකුණු 15යි)

4. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, සමාජ, ආර්ථික පරිවර්තනයන් කවරේදැයි පෙන්වා දී, එකී පරිවර්තනයන් ගෝලීකරණය හේතුවෙන් ඇති වූවක් ද යන්න විමසීමට ලක් කරන්න.
(ලකුණු 15යි)

5. ශ්‍රී ලංකාවේ විදේශීය ශ්‍රම සංක්‍රමණය කෙරෙහි, වත්මන් සමාජ ආර්ථික අර්බුදකාරී තත්වය සිදුකරන බලපෑම කෙබඳුදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

6. "ගෝලීය සන්නිවේදනය යනු සංවර්ධිත ලෝකය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර සබඳතාවය ගොඩනගන නියෝජිතයා වේ." ගෝලීය සන්නිවේදනයෙහි හිතකර සහ අහිතකර ප්‍රතිවිපාක ද ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

7. සමකාලීන ගෝලීය සමාජ සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලනික අර්බුද සමනය සඳහා තිරසර සංවර්ධන ක්‍රමෝපායන් යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 15යි)

@@@@@@@@

ඔඔ♦